# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 824 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/05/2024 පැය 1700

## මාධ්‍ය නිවේදනය

### මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට ගත් පාකිස්ථානු ජාතිකයින් 09 දෙනෙකුට ගරු මහාධිකරණය මඟින් දඬුවම් නියම කිරීම.

2020.01.01 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය හා නාවික හමුදාව ඒකාබද්ධව සිදුකරන ලද වැටලීමකදි නීති විරෝධී මත්ද්‍රව්‍ය බවට සැකකරනු ලබන ද්‍රව්‍ය කිලෝ 581 ග්‍රෑම් 34 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 614 ග්‍රෑම් 36 ක් සමඟ පාකිස්ථානු ජාතිකයින් නව දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි.

එම මත්ද්‍රව්‍ය සම්බන්ධ රස පරීක්ෂක වාර්තාව ශුද්ධ වාර්තාවක් ලෙස ලැබී ඇති අතර එය කෙටමින් මත්ද්‍රව්‍ය කිලෝ 491 ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 500 ක් වශයෙන්ද, මෙත්ඇම්පිටමින් කිලෝ 471 ග්‍රෑම් 955 මිලිග්‍රෑම් 500ක් ලෙස විශ්ලේෂණය කර 2021.09.28 වන දින වාර්තාවක් ලැබී ඇත.

ඒ අනුව ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලැබීමෙන් පසු කොළඹ මහාධිකරණයේ චූදිතයන්ට එරෙහිව නඩු පවරා 2024.05.06 වන දින නඩුව කැඳවූ අවස්ථාවේ චූදිතයින් සියළු දෙනා වරද පිළිගෙන ඇති අතර එක් චූදිතයෙකුට වසර 10 බැගින් සිර දඩුවම් නියම කර ඇත.

මෙම සැකකරුවන් අදාල දඩුවම ක්‍රියාත්මක කිරිම සඳහා පාකිස්ථානය වෙත පිටුවහල් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**